**කුරුණෑගල ප්‍රාදේශීය සභාව - 2022**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියන් රු.618,556 ක් ද කර්මාන්ත ණයහිමියන් රු.1,309,569 ක් ද, ව්‍යාපෘති ණයහිමියන් රු.1,573,371 ක් ද, ලංකා ටෙලිකොම් ණයහිමියන් රු.1,992,698 ක් හා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.8,838,230 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සභාවේ ගොඩනැගිලි සංවර්ධන වියදම් රු.1,104,829 ක්, උපකරණ වියදම් රු.1,113,050 ක් හා කාර්යාල උපකරණ හා ලීබඩු සවිකිරීම් රු.17,869,549ක් හා නව කාර්යාලයේ වායුසමීකරණ යන්ත්‍ර සවිකිරීම සඳහා වූ රු.787,958 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු රු.32,990 කින් පොලී ආදායම වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර ලැබී තිබූ පොලී රු.2,048,732 ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.32,990 ක පොලිය අඩුකර 2023 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේශීය ණය සංවර්ධන ණය ශේෂය රු.61,706 කින් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාලව පෙර වර්ෂයේ ලැබූ ආදායම් රු.72,377 ක් වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත නොකර අවිනිශ්චිත ගිණුමට බැර කර තිබුණි. | පෙර වසරේ ලැබූ ආදායම රු.72,377 කලින් ලැබූ ආදායම ආරම්භක ශේෂ නිවැරදි කර අවිනිශ්චිත ගිණුමට බැර කිරීමේ වරද 2023 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | -එම- |
| (ඊ) | සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමයට පිළියෙළ කර තිබූ අතර එය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | ආදායම් වියදම් ප්‍රකාශය අනුව බදු හා පොලී වලට පෙර පුනරාවර්තන වියදම මත අතිරික්තය රු.4,249,240 කින් වැඩියෙන්ද ණයගැති වැඩිවීම රු.41,231,165 කින් අඩුවෙන්ද, සේවක ණය අඩුවීම රු.226,255 කින් වැඩියෙන්ද, ණයහිමි අඩුවීම රු.36,796,499 ක් වැඩියෙන් හා ගෙවිය යුතු තැන්පත් වැඩිවීම රු.47,097,048 කින් වැඩියෙන්ද ගලපා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ii) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව වර්ෂයේ කාර්යය මණ්ඩල ණය ඉහළ යාම රු.113,232 ක් අඩුකල යුතු වුවත්, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.113,023ක් ලෙස එකතු කර තිබුණි. | -එම- | -එම- |
| (iii) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව ණයහිමි අඩුවීම රු.87,914,189 ක් අඩුකළ යුතු වුවත්, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.124,710,688 ක් ලෙස අඩුකර තිබුණි. | -එම- | -එම- |
| (iv) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයට අනුව නැවත ගෙවිය යුතු තැන්පත්වල ඉහළ යාම රු.941,013 ක් එකතු කළ යුතු වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගෙවිය යුතු තැන්පත් ඉහළ යාම රු.46,156,035 ක් අඩු කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 02 කට අදාල මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා මුදල් පොතෙහි දැක්වෙන ශේෂයන් අතර රු.220,437,987 ක වෙනසක් විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | වෙනස හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත්වල වටිනාකම රු.13,796,273 ක් වුවත් පුස්තකාල 08 කට අදාළ ශේෂයන් හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.4,259,900 ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 09 කට අදාලව ගිණුම් සමඟ ඉදිරිපත් කළ උපලේඛනය හා ලෙජර් ගිණුම් අනුව රු.252,332,289 ක වෙනසක් විය. | අඩුපාඩුව ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා උපලේඛනවල ශේෂයන් සමාන විය යුතුය. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.56,381 ක බැර ශේෂයක් සහිත අවිනිශ්චිත ගිණුමක් පෙන්නුම් කර තිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු හේතුවෙන් පැන නැගී ඇත. 2023 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශේෂය හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 104 (3) | සමාලෝචිත වර්ෂය තුළ වාහන 06 ක් අනතුරු වලට ලක් වී රු.1,363,090 ක අලාභයක් සිදුව තිබූ අතර, ඉන් එක් අනතුරක් සඳහා ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කර තිබූ නමුත් ඉතිරි අනතුරු 05 සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී සිදුවී ඇති අනතුරු වෙනුවෙන් වාහන 05 ප්‍රාරම්භක වාර්තා යැවීම අතපසුවී ඇති අතර ඉදිරියේදී සෑම අනතුරු සිදුවීමක් සම්බන්ධවම ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | යථෝක්ත මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ. 571 (2) | වසර 02 කාලය ඉක්ම වූ මිශ්‍ර තැන්පත් රු.8,502,693 ක් නියාදනය කර නොතිබුණි. | වර්ෂ 02 කට වැඩි තැන්පතු නිදහස් කිරීම සඳහා ලිපි මගින් තැන්පත්කරුවන් දැනුවත් කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව. | යථෝක්ත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 නොවැම්බර් 02 දිනැති අංක 2015/01 දරන වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛ | | | |
| (i) | 3 (I) වගන්තිය | උපරිම වැය සීමාව වූ රු.15,000 ඉක්මවා පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙලේ බර ඉසිලීමේ ලෝකඩ පදක්කම දිනූ ක්‍රීඩකයාට රු.200,000 ක් ගෙවා තිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණ පිළිගන්නා බව. | යථෝක්ත චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 3 (II) වගන්තිය | උපරිම වැය සීමාව වූ රු.20,000 ඉක්මවා ආගමික සිද්ධස්ථාන 02 කට රු.300,000 බැගින් රු.600,000 ක් ලබා දී තිබුණි. | -එම- | -එම- |
| (iii) | 3 (IV) වගන්තිය | උපරිම වැය සීමාව වූ රු.10,000 ඉක්මවා කුරුණෑගල දිස්ත්‍රික් කාරක සභාව විසින් සංවිධානය කරනු ලබන ඇතුගල්පුර තරුණ පරපුර සඳහා රු.150,000 ක් ගෙවා තිබුණි. | -එම- | -එම- |
| (iv) | 3 (V) වගන්තිය | උපරිම වැය සීමාව වූ රු.25,000 ඉක්මවා අඩු ආදායම් ලාභියෙකු සඳහා නිවාස ආධාර රු.100,000ක් ලබා දී තිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.295,226,983 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 153,025,837 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතුව පැවති රු.30,000,000ක් වටිනා ස්ථාවර තැන්පතුවක් සභා අනුමැතියකින් තොරව පොදු අරමුදලට මාරුකර තිබුණි. | වියදම කළ ආකාරය සොයා බලා ඉදිරියේදී ඉදිරිපත් කරන බව. | මනා මූල්‍ය පාලනයක් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවී අගරු වී ඇති එකතුව රු.37,677 ක් වටිනා චෙක්පත් 04 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 16,860 | 19,241 | 16,465 | 12,532 | 11,796 | 12,332 | 8,903 | 13,186 |
| කුලී | 2,460 | 1,855 | 1,861 | 52 | 2,650 | 1,863 | 1,364 | 556 |
| බලපත්‍ර ගාස්තු | 1,975 | 2,781 | 2,781 | - | 1,701 | 2,290 | 2,290 | - |
| වෙනත් ආදායම් | 145,328 | 183,149 | 275,876 | 124,252 | 142,420 | 286,355 | 194,220 | 216,979 |
| **එකතුව** | 166,623 | 207,026 | 296,983 | 136,836 | 158,567 | 302,840 | 206,777 | 230,721 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති රු.9,757,452 ක හිඟයෙන් රු.5,490,454 ක මුදලක්ද වර්ෂයේ බිල්කිරීම් රු.19,241,457 ක මුදලින් රු.7,042,802 ක මුදලක් ද අයකර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ වරිපනම් හා බදු හිඟ මුදලින් ප්‍රවර්තන වර්ෂයට අදාළ රු.19241457 ක මුදලින් සහ හිඟ 9,757,452ක මුදලින් 2023.04.30 වන විට රු.2,597,519ක මුදලක් රැස් කරගෙන ඇති බව. | හිඟ ආදායම් හා බිල්කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.510,745 ක අක්කර බදු හිඟයක් පැවතුණි. | ඉදිරියේදී අක්කර බදු හිඟය අවම කර ගැනීමට බලාපොරොත්තු වන බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු වත්කම් 19 ක් 2022 වර්ෂය තුළ බදු දීමට කටයුතු නොකිරීම නිසා සභාවට රු.1,064,875 ක ආදායමක් අහිමි වී තිබුණි. | සභාව සතු වත්කම් 19 ක් 2022 වර්ෂය තුළදී බදු දීමට නොහැකි වූ බව. | සභාව සතු දේපල බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ත්‍රීරෝද රථ සම්බන්ධයෙන් සිදුකර තිබූ සමීක්ෂණයට අනුව බලප්‍රදේශය තුළ ලියාපදිංචි වී තිබුණු ත්‍රීරෝද රථ සංගම් ගණන 55 තුළ ත්‍රීවීල් රථ 412ක් පැවති අතර, ඉන් ත්‍රීවීල් රථ 346 කින් වර්ෂය තුළ රු.242,200 ක ගාස්තු අයකර නොතිබුණි. | දැනට අය කර ගැනීමට ඇති රු.242,200 ක මුදලින් දැනට හිඟ මුදල් ලෙස ත්‍රීරෝද රථ 10 කින් රු.7000 ක මුදලක් අය කර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් ප්‍රමාණය මෙම වර්ෂය තුළ අය කර ගන්නා බව. | හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ක්‍රීඩාභූමි 26 ක් පැවති අතර ඉන් ක්‍රීඩා භූමි 16 ක් සමාලෝචිත වර්ෂය වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ක්‍රීඩාභූමි 26න් ක්‍රිඩා භූමි 16 ක් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | 1947 අංක 08 දරණ රාජ සන්තක ඉඩම් ආඥා පනතේ 2.4.1 වගන්තිය අනුව කටයුතු කර පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු ගල් රෝල 2016 වර්ෂයේ සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. | මෙම ගල්රෝල විශාල වීම හේතුවෙන් සහා මාර්ග සඳහා යොදා ගැනීමේ ගැටළුකාරී තත්ත්වය මත මෙතෙක් ප්‍රයෝජනයට ගත නොහැකි වී ඇති බව. | වෙනත් ආයතනයකට මුදා හැරීමට හෝ අපහරණ කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් මඟින් නිම කිරීමට යෝජිතව තිබූ වටිනාකම රු.3,692,355 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 03 ක වැඩ ආරම්භ කර නොතිබුණි. | ඉදිකිරීමට ප්‍රමාද වූ බව. | වාර්ෂික අයවැයෙන් වෙන් කරන ලද මුදල්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |